# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO — 282/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 16/02/2024 පැය 1340

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම - මිහින්තලය පොලිස් වසම.**

2024.02.15 වන දින රාත්‍රී කාලයේ මිහින්තලය පොලිස් වසමේ කැලෑ තිරප්පනය, ඉහළගම ප්‍රදේශයේ නිවසක සිටි කාන්තාවකට මොට ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට මිහින්තලය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවරුදු 23 ක් වූ කැලෑ තිරප්පනය, ඉහළගම ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

පවුල් ආරවුලක් හේතුවෙන් සැමියා විසින් පහරදී මෙම ඝාතනය සිදු කර ඇති බවට තොරතුරු අනාවරණය වී ඇති අතර වයස අවුරුදු 32 ක් වූ සැකකරු මිහින්තලය පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගෙන ඇත.

මෘතශරීරය සිද්ධිය වූ ස්ථානයේ ඇති අතර අනුරාධපුර ගරු මහේස්ත්‍රාත්තුමා විසින් මහේස්ත්‍රාත් පරික්ෂණයක් පැවැත්වීමට නියමිතය. මිහින්තලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**